**කැකිරාව ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ ප්‍රාග්ධන ස්වරූපයේ ව්‍යාපෘති 03 කට අදාළ සහතික කළ වැඩ රු.5,059,572 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | සහතික කළ වැඩවල වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන සහ වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් ආයුර්වේද මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනට තිබුණු රු.262,792 ක ඖෂධ තොගය සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ තොග යටතේ දක්වා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.2,954,051 ක ඖෂධ මිලදීගෙන තිබුණු නමුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.2,251,435 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හබරණ සතිපොළට රු.120,000 ක බොරළු යෙදීම් පුනරාවර්තන වියදම් ලෙස නොදක්වා ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | බොරළු මාර්ග ඉදිකිරීම පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | නව සභා ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට සහතික කළ වැඩවල වටිනාකම රු.63,704,359 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.58,025,712 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ නැණසල ආදායම් බිල්කිරීම රු.204,100 ක් වුවත්, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.192,200 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ගිවිසුමක් හෝ බැඳීමක් නොමැතිව විවිධ ණයහිමියෝ යටතේ සමාලෝචිත වර්ෂයේ රු.1,192,369 ක ජංගම වගකීමක් ගිණුම්ගත කිරීම සිදුකිරීම නිසා සභාවේ ජංගම වගකීම් එම වටිනාකමින් වැඩි වී තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලා ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතු හා මූලා ප්‍රකාශනවල ගිණුම් 09 ක ශේෂයන් අතර රු.7,563,071 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | අයිතම් 04 කට අදාළව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණු වටිනාකම රු.79,753,248 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනය අනුව එම වටිනාකම රු.92,041,291 ක් වුයෙන් රු.12,288,043 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 ඡේදය | සභාව සතු වාහන 16 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | පිළිගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.19,793,492 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.19,526,542 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ලැබී තිබුණු මුද්දර ගාස්තු රු.4,348,131 ක් හා උසාවි දඩ මුදල් රු.6,820,255 ක් අත්‍යවශ්‍ය කාර්යයන් හෝ ව්‍යාපෘති සඳහා වැය නොකර පොදු තැන්පත් ගිණුම තුළ රඳවා තිබුණි. | පිළිගන්නා බව. | මුදල් නිෂ්කාර්යව නොතබා අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා යෙදවිය යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,499,935 | 9,644,160 | 10,580,971 | 4,897,429 | 8,346,305 | 8,310,096 | 7,967,449 | 5,834,240 |
| (ii) | කුලී | 15,463,600 | 13,018,269 | 11,905,888 | 7,173,056 | 16,545,100 | 11,559,206 | 12,244,842 | 6,060,675 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,932,650 | 7,921,792 | 8,008,292 | 258,500 | 5,899,650 | 4,675,015 | 4,920,215 | 345,000 |
| (iv) | වෙනත් ආදායම් | 37,287,000 | 51,605,675 | 7,932,587 | 49,508,307 | 23,376,000 | 49,893,169 | 107,199,470 | 5,835,219 |
| | | 67,183,185 | 82,189,896 | 38,427,738 | 61,837,292 | 54,167,055 | 74,437,486 | 132,331,976 | 18,075,134 |

## 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.3,363,457 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | බල ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාර සහ කර්මාන්ත පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදුකර එම ආදායම් නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත බදු රු.29,250 ක් ද ව්‍යාපාර බදු රු.99,460 ක් ද අයකරගෙන නොතිබුණි. | සමීක්ෂණ කටයුතු සිදුකර ඇති බව. | සමීක්ෂණ කටයුතු නියමිත කාලය තුළ සිදුකර වාර්තා සකස් කර තිබිය යුතුය. |
| (iii) | වසා දමා ඇති රාණි සිනමා ශාලාව වෙනුවෙන් රු.773,887 ක් ද පවත්වාගෙන යන EDC සිනමා ශාලාවෙන් රු.631,274 ක් ද 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වුවත්, එම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා පැවරූ නඩුව ගොනු කිරීමේ අඩුපාඩු හේතුවෙන් විත්තිකරු නිදහස් වීම මත එම මුදල අයකර ගැනීමට නොහැකි වී ඇති බව. | නඩුව නිවැරදිව ගොනු කිරීමට අදාළව වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර සභාවට සිදු වූ පාඩුව අයකරගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | සභාවට අයත් කඩ කාමර 14 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.2,206,425 ක් අයකරගෙන නොතිබුණු අතර, කුලී නොගෙවන කඩ කාමරවල ගිවිසුම් අවලංගු කර එම හිඟ කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නඩු තීන්දු ලැබුණු පසු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ජංගම කඩ කාමර 07 ක් වෙනුවෙන් අයවිය යුතු රු.135,000 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණු අතර, කුලී නොගෙවන කඩ කාමර නැවත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කුලී නොගෙවන කඩ කාමර නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව සතු වත්කම් බදුදීම් වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.2,659,132 ක් වූ අතර වසර 01 ත් 13 ත් අතර කාලයක සිට පැවත එන එම හිඟ කුලී මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. | එන්තරවාසි යොමුකර රු.40,695 ක් අයකරගෙන ඇති බව හා ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | නීතිමය කටයුතු සිදුකර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | සභාව සතු යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.1,956,804 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | රු.175,000 ක් අයකරගෙන ඇති බව හා ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදුකළ යුතුය. |
| (ඈ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | වෙළඳ ආයතන වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ගාස්තු රු17,000 ක් ද දැන්වීම් පුවරු 05 ක් වෙනුවෙන් දැන්වීම් පුවරු ගාස්තු රු.115,500 ක් ද පරිසර බලපත්‍ර ගාස්තු රු.68,000 ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | වෙළඳ බලපත්‍ර සඳහා රු.3,000 ක් ද, දැන්වීම් පුවරු සඳහා රු.55,000 ක් ද අයවී ඇති බව. | ඉතිරි හිඟ මුදල් ද අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.48,225,326 ක් හා මුද්දර ගාස්තු රු.989,500 ක් ලැබිය යුතුව තිබුණු අතර 2023 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ද තහවුරු කරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර පළාත් පාලන අමාත්‍යවරයා විසින් 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 හා 2016 මාර්තු 30 අංක 1960/35 දරන ගැසට් නිවේදනය අනුව පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව 2016 ඔක්තෝබර් 10 දින සිට සභාව විසින් වැලඳගෙන තිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් මරදන්කඩවල, පලුගස්වැව සහ මඩාටුගම උප කාර්යාල පිළිබඳව ප්‍රමාණවත් අධීක්ෂණයක් සහ අවශ්‍ය පහසුකම් ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | උප කාර්යාලවලට ප්‍රමාණවත් පහසුකම් ලබාදීම සහ එහි කටයුතු අධීක්ෂණය කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයෙන් ඉවත්කර වසර 01 සිට වසර 08 කට අධික කාලයක් ගතවී තිබුණු වාහන 04 ක් අපහරණය කිරීමට ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ඉංජිනේරු වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | අපහරණ කටයුතු ප්‍රමාද නොකර සිදුකළ යුතුය. |
| (ආ) | සභාවට අයත් පැරණි කඩ කාමර 07 ක් අලුත්වැඩියා කර බඳුදීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අලුත්වැඩියා නිමකර බඳුදීම සඳහා කටයුතු කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇති බව. | අවශ්‍ය විස්තර සහිතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |